# ද මැසිනෝද් විදුහල - කඳාන

# De Mazenod College – Kandana

## ඉතිහාසය I

Learning Resource Centre
R
De Mazenod College
Kandana

පළමුවන වාර පරීක්ෂණය - 2024 | 11 ශ්‍රේණිය | පැය 01 යි

2024-06

සැලකිය යුතුයි

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*
- *අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.*

---

1) ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව හදාරන්නෙකුට වඩාත්ම වැදගත්වන දේශීය සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
   1. දාඨාවංසයයි.
   2. බෝධිවංසයයි.
   3. මහාවංසයයි.
   4. දීපවංසයයි.

2) අග්ව හිස සහ මීතිසා දැක්වෙන මූර්තිය පිහිටා ඇත්තේ මින් කුමන ස්ථානයේ ද?
   1. අභයගිරිය
   2. ජේතවනාරාමය
   3. ගල් විහාරය
   4. ඉසුරුමුණි විහාරය

3) පහත සඳහන් විදේශිකයන් අතුරින් ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැකබලා වාර්තා සැකසූ අය දැක්වෙන පිළිතුර තෝරන්න.

   A. රිබෙයිරෝ　　B. ඇරිස්ටෝටල්　　C. රොබට් නොක්ස්
   D. පිලිප්පස් බැල්ඩියස්　　E. හියුං සියැං හිමි

   1. ACD
   2. ACE
   3. BCD
   4. BDE

4) ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අතුරින් බෙල්ලන්බැඳි පැලැස්ස සම්බන්ධයෙන් නිවැරදි වගන්තිය තෝරන්න.
   1. කෙත් කලාපීය එළිමහන් වාසස්ථානයකි.
   2. කඳුකර එළිමහන් දඩයම් වාසස්ථානයකි.
   3. පහතරට වියළි කලාපීය ලෙනකි.
   4. පහතරට තෙත් කලාපීය ලෙනකි.

5) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් ඉතා වැදගත් සිදුවීමක් වන්නේ,
   1. ක්ෂුද්‍ර ශිලා මෙවලම් භාවිත කිරීමයි.
   2. යකඩ හා ලෝහ භාවිත කිරීමයි.
   3. සංචාරක ජීවිතයක් ගත කරමින් ගල් ගුහාවල ජීවත් වීමයි.
   4. අල වර්ග හා සතුන් පුලුස්සා ආහාරයට ගැනීමයි.

6) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශවල සිදුවූ බව නූතන පුරා විද්‍යාඥයන්ගේ මතය වී තිබේ. ඒ බව සනාථ කෙරෙන ගංගා නිම්නයක් වන්නේ කුමක්ද?
   1. ගල් ඔය
   2. කිරිඳි ඔය
   3. මල්වතු ඔය
   4. යාන් ඔය

7) සෙල්ලිපියක නරේශ්වර යන නමින් තමන්ව හඳුන්වා ගෙන ඇති රජතුමා,
   1. දුටුගැමුණු රජු
   2. කුටකණ්ණ අභය රජු
   3. පළමුවන කාශ්‍යප රජු
   4. මහසෙන් රජු

8) පහත **A** තීරුවේ ඇති සාහිත්‍ය මූලාශ්‍රය අතර **B** තීරුවේ ග්‍රන්ථ හා ගැළපූ විට ලැබෙන පිළිතුරු වරණය තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| i. | කුම්භකාරගාම | A | වඩුවන් විසූ ගම් |
| ii. | කේවට්ටගාම | B | ගොවියන් විසූ ගම් |
| iii. | වඩ්ඩකීගාම | C | වළං තනන්නන් විසූ ගම් |
| iv. | කසීකාරගාම | D | මැණික් කර්මාන්තයේ යෙදුණු ගම් |
| | | E | ධීවරයන් විසූ ගම් |

1. BDAC  2. ACED  3. CEAB  4. CEAD

9) ගම් නායකයෙකු වීම සඳහා අවශ්‍ය යැයි සැලකුන වැදගත් ම සුදුසුකම මින් කුමක්ද?

1. දේශපාලන පළපුරුද්ද
2. ආර්ථික වශයෙන් චක්පොහොසත් වීම.
3. ගම්වැසියන් අතර ජනප්‍රිය වීම.
4. උසස් කුලයකින් පැවත ඒම.

10) රාජ්‍යත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රධාන ප්‍රතිඵලය වූයේ,

1. බලය විමධ්‍යගත වීමය.
2. රාජධානි අතර ගැටුම් ඇති වීමය.
3. ප්‍රාදේශීය පාලකයන් බලවත් වීමය.
4. බලය මධ්‍යගත වීමය.

11) වෙළෙඳපොළක පාලන කටයුතු සම්බන්ධ නීති රීති ඇතුළත් සෙල්ලිපිය වන්නේ,

1. වේවැල්කැටිය සෙල්ලිපියයි.
2. බදුලු වැම් ලිපියයි.
3. මිහින්තලා පුවරු ලිපියයි.
4. ගොඩවාය සෙල්ලිපියයි.

12) හේමමාලා සහ දන්ත කුමරුන් මෙරටට ගොඩබට වරාය ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ,

1. ජම්බුකෝළ පට්ටන
2. ලංකා පට්ටන
3. ගෝකණ්ණතිත්ථ
4. මහාතිත්ථ

13) තිරුකේතීශ්වරම් හින්දු කෝවිල ඉදි කර ඇත්තේ කවර ප්‍රදේශයක ද?

1. ගෝකණ්ණතිත්ථ වරායට සමීපව ය.
2. මාතොට වරායට සමීපව ය.
3. කලාඔය මුවදොර සමීපව ය.
4. හලාවත කලපුව සමීපව ය.

14) රතුකැට දිවයිනේ රජු ඉස්ලාමීය රජු සමග තෑගී හුවමාරු කරගත් බව සඳහන් කර ඇති අරාබි ජාතික ඉතිහාසඥයා,

1. ඉබ්න් බතුතා
2. සුලෙයිමාන්
3. ඔනෙසික්‍රිටස්
4. අල් බලසූරි

15) සැලසුම, තාක්ෂණය හා අලංකරණය යන කරුණු අතින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම නාගරික උද්‍යානය ලෙස සැලකෙනුයේ,

1. මහමෙව්නා උද්‍යානයයි.
2. දීප උද්‍යානයයි.
3. සීගිරි උද්‍යානයයි.
4. රන්මසු උද්‍යානයයි.

16) අතීත වාස්තු විද්‍යාත්මක නිර්මාණ වලදී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බවට හොඳ නිදසුනක් වන්නේ,

1. සීගිරි රජ මාළිගයයි.
2. ආලාහන පිරිවෙනයි.
3. මිහින්තලේ දාන ශාලාවයි.
4. මැදිරිගිරි වටාදාගෙයයි.

17) පොළොන්නරු යුගයේ දී 'ගාවුත කණු' භාවිත කර ඇත්තේ,

1. මහා මාර්ගවල දුර දැක්වීමටය.
2. රාජ්‍ය අයිතිය දැක්වීමටය.
3. ඇළ මාර්ගවල දුර දැක්වීමටය.
4. අභයභූමිවල සීමා දැක්වීමටය.

18) අතීත සමාජයේ යම් අපරාධකරුවකු ගමක සැඟවී සිටින අවස්ථාවක ඔහු අල්ලා දීමේ වගකීම පැවරී තිබුණේ,

1. ගමිකට ය.
2. ගමේ සියලු දෙනාට ය.
3. දසගම් ඇත්තන්ට ය.
4. සරුමුකට ය.

19) අපේ රටේ ඉතා පුරාණ කාලයේ සිට විසූ ජනතාව කැඳ වර්ග තම ආහාරය සඳහා එක්කර ගැනීමට ප්‍රධානතම හේතුව වූයේ කුමක්ද?

1. සකසා ගැනීමට පහසු වීම.
2. දිරවා ගැනීමට පහසු වීම.
3. කැඳ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සුලභ වීම.
4. ශරීර ශක්තිය වර්ධනය වීම.

20) උස් බිම්වල ධනාන්තර නොකළ යුතු බවට නීති පැනවීමෙන් අතීත රජවරු බලාපොරොත්තු වූයේ,

1. ජල උල්පත් සිඳියාම වළක්වා ගැනීමය.
2. වැව්වලට රොන්මඩ එකතු වීම වළක්වා ගැනීමය.
3. වන සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා කර ගැනීමය.
4. වගාබිම්වල පස නිසරුවීම වළක්වා ගැනීමය.

21) කාලිංග මාඝ හා චන්ද්‍රභානු යන ආක්‍රමණිකයන්ගෙන් රට මුදාගත් පාලකයා,

1. පළමුවන විජයබාහු
2. පළමුවන පරාක්‍රමබාහු
3. දෙවන පරාක්‍රමබාහු
4. තුන්වන විජයබාහු

22) ගම්පොළ රාජධානි සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ,

1. හින්දු හා මහායාන බලපෑම නිසා පිළිම ගෙවල්වල දේවාල ඉදි කිරීම ය.
2. සංදේශ කාව්‍ය ලිවීම ආරම්භ කිරීම ය.
3. මධ්‍ය පාර්ශ්වයෙන් රාජ්‍ය උරුමවීමේ ක්‍රමයක් ආරම්භ වීම ය.
4. රාජ්‍ය උරුමය එකම රාජකීය පවුලක පිය පුතු ක්‍රමයට හිමි වීම ය.

23) ශ්‍රී ලංකාවේ පැවති රාජධානි කිහිපයක් I තීරුවේ ද පැරණි පරිපාලන බෙදුම් කිහිපයක් II තීරුවේ ද දැක්වේ I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| | I | | II |
|---|---|---|---|
| i. | අනුරාධපුරය | A | මායාරට |
| ii. | මහනුවර | B | රජරට |
| iii. | කෝට්ටේ | C | රුහුණු රට |
| | | D | මලය රට |

1. ABC
2. ABD
3. BAC
4. BDA

24) මහනුවර පුරවරට ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනගන ලද රජතුමා,

1. පළමුවන රාජසිංහ
2. සේනා සම්මත වික්‍රමබාහු
3. ජයවීර බණ්ඩාර
4. පළමුවන විමලධර්මසූරිය

25) පහත දැක්වෙන මහනුවර රාජධානියේ ඉඩම් සම්බන්ධයෙහි A හා B ගැළපූ විට පිළිතුර කුමක්ද?

| | A | | B |
|---|---|---|---|
| i. | ගබඩාගම් | A | රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් |
| ii. | නින්දගම් | B | විහාරාරාම සඳහා පූජා කළ ඉඩම් |
| iii. | විහාරගම් | C | රජු සහ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් |
| | | D | දේවාල සඳහා පූජා කළ ඉඩම් |

1. ACD 2. BDA 3. CAB 4. CBD

26) යුරෝපීය පුනරුදයේ ආරම්භය සිදුවුයේ ඉතාලියේ,

1. රෝම නගරයේ ය.
2. ජීනෝවා නගරයේ ය.
3. ෆ්ලෝරන්ස් නගරයේ ය.
4. වෙනිසි නගරයේ ය.

27) දේශගවේෂණ ව්‍යාපාරයේ දී සොයාගත් ප්‍රදේශ හා ඒවාට දායක වූ පුද්ගලයන් පහත A හා B තීරුවල දැක්වේ ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න

| | A | | B |
|---|---|---|---|
| i. | සුභ පැතීමේ තුඩුව | A | බර්තලමියුඩයස් |
| ii. | කැලිකට් | B | ක්‍රිස්ටෝපර් කොලොම්බස් |
| iii. | පිලිපීනය | C | වස්කෝද ගාමා |
| iv. | බටහිර ඉන්දීය දූපත් | D | මැගලන් |

1. ADCB 2. BCDA 3. DCBA 4. ACDB

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරින් 28 හා 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A. දන්තුරේ සටනින් පෘතුගීසින් පරාජය කිරීම.
B. කුසුමාසන දේවි දෝන කතිරීනා නමින් බෞතීස්මය ලැබීම.
C. නායක්කර් වංශයට මහනුවර රාජ්‍යයේ උරුමය හිමිවීම.
D. මෙරට සියම් නිකායේ ආරම්භය සිදුවීම.

28) ඉහත සිදුවීම්වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙළ දක්වන්න

1. ABDC 2. BCAD 3. ACBD 4. BACD

29) C අක්ෂරයෙන් දැක්වෙන ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ රජතුමා කවුරුන්ද?

1. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
2. කීර්ති ශ්‍රී රාජසිංහ
3. ශ්‍රී විජය රාජසිංහ
4. රාජාධිරාජසිංහ

30) යාපන රාජ්‍යයේ බිඳ වැටීම සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. රාජ්‍ය උරුමකරුවන් අතර ඇති වූ බල අරගලය.
2. යාපන පාලකයන්ට නිත්‍ය හමුදාවක් නොසිටීම.
3. ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම.
4. යාපනයේ බහුතර ජනතාව පෘතුගීසින්ට පක්ෂපාතී වීම.

31) එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා විසින් ලංකාවේ ඉදිකරන ලද ප්‍රථම මහා මාර්ගය වූයේ,

1. කොළඹ - මහනුවර මාර්ගයයි.
2. මහනුවර - කුරුණෑගල මාර්ගයයි.
3. මහනුවර - දඹුල්ල මාර්ගයයි.
4. මහනුවර - බදුල්ල මාර්ගයයි.

2024-06

32) විසිවන සියවසේ මුල් දශක කිහිපයක තුළ කාර්මික ක්ෂේත්‍රයේ අති විශාල ප්‍රගතියක් උදාකරගත් ආසියාතික රට,

1. ජපානය
2. චීනය
3. ඉන්දියාව
4. දකුණු කොරියාව

- කාර්මික විප්ලවයේ නිපදවන ලද පහත සඳහන් උපකරණ ඇසුරින් 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A. දුවන නඩාව
B. රෝලර් යන්ත්‍රය
C. ආරක්ෂක ලාම්පුව
D. මියුල් යන්ත්‍රය

33) පේෂ කර්මාන්තයේ දියුණුව සඳහා උපයෝගී වූ නිමැවුම් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා C
2. A හා D
3. B හා D
4. B හා C

34) යකඩ හා වානේ හා ගල් අඟුරු කර්මාන්තයේ දියුණුවට උපයෝගී වූ නිමැවුම් දෙක ඇතුළත් පිළිතුර කුමක්ද?

1. B හා D
2. C හා D
3. A හා C
4. B හා C

35) 1623 දී ලන්දේසීහු එහි සිටි ඉංග්‍රීසින් පිරිසක් ඝාතනය කළ කුළුබඩු දිවයින්වලට අයත් දූපත කුමක්ද?

1. සුමාත්‍රා දූපත
2. ඇම්බොයිනා දූපත
3. ජාවා දූපත
4. බෝර්නියෝ දූපත

36) පහත A සිට D දක්වා ඇති ස්ථාන අතුරෙන් ප්‍රංශවරුන් විසින් ඉන්දියාවේ පිහිටුවන ලද වෙළෙඳ මධ්‍යස්ථාන දැක්වෙන පිළිතුර කුමක්ද?

A. මද්‍රාසිය
B. බොම්බාය
C. පොන්ඩිචේරි
D. චන්ද්‍රනගර්

1. A හා B
2. A හා D
3. B හා C
4. C හා D

37) ඉංග්‍රීසින්ට මහනුවර රාජධානිය පහසුවෙන් යටත් කර ගැනීමට තුඩුදුන් වැදගත්ම සාධකය වූයේ,

1. මහජනතාව ඉංග්‍රීසින්ට එකතු වීමයි.
2. ඉංග්‍රීසින්ගේ යුද ශක්තියයි.
3. රජු හා මහජනතාව අතර සබඳතාව දුරස් වීමයි.
4. ඉංග්‍රීසින් මුහුදුබඩ වැසියන් සහයෝගය දැක්වීමයි.

38) ඉංග්‍රීසින්ට උඩරට යටත් කර ගැනීමේ ව්‍යාපාරයේ දී උපායශීලී ලෙස කටයුතු කිරීමෙන් දායකත්වය දැක්වූ පුද්ගලයා ලෙස සැලකෙනුයේ,

1. මේජර් හුක් ය.
2. ඇහැලේපොළ අධිකාරම් ය.
3. ජෝන් ඩොයිලි ය.
4. රොබට් බ්‍රවුන්රිග් ය.

39) 1815 උඩරට ගිවිසුම සිදුවන වන විට ඉංග්‍රීසි කොඩිය බිම දමා සිංහ කොඩිය යළි එසවීමට කටයුතු කළ භික්ෂූන් වහන්සේ වන්නේ,

1. කඩහාපොළ හිමියන්
2. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්
3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්
4. වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන්

40) 1815 උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් ප්‍රකාශ කර ඇත්තේ

1. උඩරට සාම්ප්‍රදායික නිලධාරි පන්තියේ වරප්‍රසාද හා අයිතිවාසිකම් සුරකින බවය.
2. බුද්ධ ශාසනය හා දේවාගම කඩ නොකොට පවත්වාගෙන යන බවය.
3. රජුට හා ඥාතීන්ට උඩරට සිහසුනට ඇති අයිතිවාසිකම් අහිමි බවය.
4. උඩරට රාජධානියේ අධිකරණ කටයුතු පවත්වාගෙන අයුරුය.



Learning Resource Centre R De Mazenod College Kandana

ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

Learning Resource Centre R De Mazenod College Kandana

## ඉතිහාසය

2024.04

පළමු වාර පරීක්ෂණය-2024 | 11 ශ්‍රේණිය | කාලය පැය 03

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4ක් ද III කොටසින් ප්‍රශ්න 1ද පිළිතුරු සැපයිය යුතුය. මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

1) (අ)

i. පහත දැක්වෙන ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

මන්නාරම/ දැදුරු ඔය/ නල්ලූර්/ සොරබොර වැව/ ගොඩවාය/ කතරගම/ කාලතිත්ථ/ ලංකාපට්ටුන/ සෙංකඩගල පුරය/ පඬුවස්නුවර/ මිනිහාගල්කන්ද/ මඩකලපුව


ii. ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

පෘතුගාලය/ රතුමුහුද/ මදුරාසිය/ වෙනිස්/ සුමාත්‍රා දූපත/ බෙංගාල බොක්ක

ආ) පහත ABCD වලට අදාල පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. පනාකඩුව තඹ සන්නස කර වූ රජතුමා
B. ලංකාවට බුද්ධ දහම රැගෙන එනවිට මෙහි සිටි රජතුමා
C. ගල් අගුරු ආකාරවලට ආලෝකය ලබා ගැනීමට ආරක්ෂිත ලාම්පුව නිපදවූ නැත්තා
D. ගම්පොළ රාජධානි සමයේ ලංකාවට පැමිණි ආරාබි සංචාරකයා

ඇ) A රූපය



1. රූපය නම් කරන්න.
2. මෙය කාගේ නිර් මාණයක්ද ?
3. මෙය යුරෝපයේ කවර ක්‍රියාවලියක් හා සම්බන්දවේද
4. මෙම නිර් මාණය නිසා දියුණු වූ ක්ෂේත්‍රය කුමක්ද ?

B රූපය



1. රූපය නම් කරන්න
2. මෙය කවර ඓතිහාසික යුගයකට අයත්වේද ?
3. මෙය සොයාගත් ස්ථානය කුමක්ද ?
4. මෙහි ඇති පබලු ආනයනික රට කුමක්ද ?

## II කොටස

2)

i. ආදි මානවයා ජීවත් වූ පරිසර කලාප 3ක් නම් කරන්න.
ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනුන ලක්ෂන 2ක් ලියන්න.
iii. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණික දැනුම උඩරංචාමඩම ආශ්‍රිත කැනීම්වලින් අනාවරණය කරගත් තොරතුරු 2ක් ඇසුරෙන් විස්තර කරන්න.
iv. මුල් ඓතිහාසික යුගයේ මානවයාගේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය කරුණු 3ක් ඇසුරෙන් පැහිදිලි කරන්න.

3)

i. ඇළහැර ඇළ මගින් ජලය සපයනු ලබන වැව් 3ක් නම් කරන්න.
ii.

A. මහියංගනයට දකුණු දෙසින් මහවැලි ගඟ හරස්කර තැනූ අමුණ .
B. කලා වැවේ ඇති ජලය තිසා වැවට ගෙන යෑමට නිමර්ාණය කල ඇළ ..............
C. අහසින් වැටෙන එකදිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යෑමට ඉඩ නොදිය යුතිය යන අදහස දැරූ රජතුමා
D. වර් ෂා ජලයෙන් පෝෂණය වන කුඩා වැව් පද්ධතියක් හඳුන්වන නම .............

iii. වැවක ප්‍රධාන තාක්ෂණික අංග 2ක් නම් කර එයින් සිදුවන කාර්යයන් පැහැදිලි කරන්න.
iv. අතීත ලංකාවේ යකඩ නිස්සාරණය කල ප්‍රදේශ 2ක් ලියන්න. එහි යකඩ නිස්සාරණය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

4)

i. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු පහත ප්‍රදේශයන්හි පාලන මධ්‍යස්ථාන පිහිට වූ පාලකයින් නම් කරන්න.

A. යාපහුව -
B. ගෝවින්දමලය -
C. ගංදෙනිය -

ii. පොළොන්නරු රාජධානිය පරිහානියට බල පෑ හේතු 2ක් ලියන්න.
iii. දෙවන නාගරිකරණ සමයේ ආර් ථික රටාවේ කැපී පෙනෙන ලක්ෂණ 2ක් පැහැදිලි කරන්න.
iv. හයවන පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ එක්සත් දේශපාලනයක් ගොඩ නැගීමට ගත් ක්‍රියාමාර්ග 3ක් පැහැදිලි කරන්න.

5)

i. මහනුවර රාජ්‍ය සමයේ රජතුමා විසින් විසඳන ලද නඩු වර් ග 3ක් ලියන්න.
ii. මහනුවර රාජ්‍ය සමයේ වැරදි කරුවන්ට දුන් දඬුවම් වර්ග 4ක් ලියන්න
iii. මහනුවර සමාජ සංවිධානයේ කැපී පෙනුන ලක්ෂණ 2ක් පැහැදිලි කරන්න.
iv. මහනුවර රාජධානි සමහෙයි ආර්ථික ක්‍රමය පිළිබඳ පහත කරුණු 3ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

A. කෘෂි කමර්ාන්තය
B. කමර්ාන්ත
C. සත්ත්ව පාලනය

6)

i. බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථාන 3ක් ලියන්න.
ii. ඉංග්‍රීසින්ට ත්‍රිකුණාමලය වරාය වැදගත් වීමට බලපෑ හේතු 2ක් ලියන්න.
iii. 1803 බ්‍රිතාන්‍යයන් උඩරට රාජ්‍ය අත්පත් කර ගැනීමට පෙළඹුන හේතු සාධක 2 පැහැදිලි කරන්න.
iv. a. 1818 ඌව වෙල්ලස්ස සටනට බලපෑ හේතු 3ක් පැහැදිලි කරන්න.
b. එම සටන මර්දනයට බ්‍රිතාන්‍යයන් ගත් ක්‍රියාමාගර් පැහැදිලි කරන්න.

7)

i. බ්‍රිතාන්‍ය පාලන සමයේදි මිෂනාරින් ක්‍රිස්තියානි ආගම ප්‍රචාරයට යොදාගත් ක්‍රියාමර්ග 3ක් ලියන්න.

ii. 19 සියවසේ ලංකාවට වරින් වර පැමිණි මිෂනාරි සමාගම් 4ක් ලියන්න

iii. බෞද්ධ පුනරුද ව්‍යාපාරයට නායකත්වය ගත් භික්ෂූන් වහන්සේලා තිදෙනෙක් නම් කර ඉන් එක් අයෙකුගෙන් පුනර්ජීවන ව්‍යාපාරයට සිදු වූ සේවාව පැහැදිලි කරන්න.

iv. හෙන්ඩ්‍රි ස්ටීල් ඕල්කකට් තුමා බෞද්ධ පාසල් පිහිටුවීමට කටයුතු කළ ආකාර පැහැදිලි කරන්න.

## III කොටස

8)

i. එංගලන්තයේ කාර් මික විප්ලවය වර්ධනය වූ ප්‍රධාන කර්මාන්ත 3 නම් කරන්න.

ii. කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ වීමට බල පෑ ප්‍රධාන හේතු 4ක් ලියන්න.

iii. කාර්මික විප්ලවය සමග එංගලන්තයේ කෘෂිකාර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය කරුණු 2 ඇසුනේ පැහැදිලි කරන්න.

iv. කාර් මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයට ඇතිවූ බලපෑම් 3ක් පැහැදිලි කරන්න.


9)

i. ඉතාලි පුනරුදයෙන් වර්ධනය වූ වෙළද නගර 3ක් ලියන්න.


ii. පුනරුදයට බලපෑ හේතු 2ක් ලියන්න.

iii. ඉතාලි පුනරුදයේ විද්‍යාත්මක දියුණුව කරුණු 2ක් ඇසුනේ පැහැදිලි කරන්න.

iv. පුනරුදය නිසා ඇතිවූ ගෝලිය ප්‍රවනතා 3ක් පැහැදිලි කරන්න.




Learning Resource Center
R
De Mazenod College
Kandana


N